ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය

හම්බන්තොට

***

පුවත්පත් නිවේදනය

<u>**ඉන්දීය හිටපු ජනාධිපති ශ්‍රී ප්‍රණාබ් මුඛර්ජී මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක පණිවිඩ පොතක්**</u>

ඉන්දියාවේ හිටපු ජනාධිපති ශ්‍රී ප්‍රණාබ් මුඛර්ජී මැතිතුමා 2020 අගෝස්තු 31 වන දින නව දිල්ලියේදී අභාවප්‍රාප්ත විය

ශ්‍රී ප්‍රණාබ් මුඛර්ජී මැතිතුමා 2012 ජුලි 25 වන දින සිට 2017 ජුලි 25 වන දින දක්වා ඉන්දියාවේ 13 වන ජනාධිපතිවරයා ලෙස කටයුතු කළේය. ඉන්දියාවේ ජනධිපති ධුරයට පත්වීමට පෙර එතුමා විවිධ කාලයන්හි ආරක්ෂක, වාණිජ, විදේශ කටයුතු සහ මුදල් යන අමාත්‍ය ධුර හොබවා ඇත. හත් වතාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කර ඇති එතුමා 2019 වසරේදී ඉන්දියාව විසින් සිවිල් පුරවැසියෙකුට පිරිනමන ඉහලම සම්මානය වන භාරත් රත්න සම්මානයෙන් පිදුම් ලැබීය.

එතුමා හට ගෞරව දැක්වීමක් වශයෙන් 2020 අගෝස්තු 31 වන දින සිට 2020 සැප්තැම්බර් 6 වන දින දක්වා ඉන්දියාව පුරා දින හතක ශෝක කාලයක් ප්‍රකාශයට පත් කර ඇත.

එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක පණිවිඩ පොතක් 2020 සැප්තැම්බර් 02 සහ 03 යන දෙදින 107-බී, අලුත් පාර හම්බන්තොට හි පිහිටි හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලයේ පෙ.ව.10.00 සිට ප.ව 4.00 දක්වා විවෘතව තැබෙනු ඇත.

****

හම්බන්තොට

ශක වර්ෂ 1942 භද්‍ර 10

2020 සැප්තැම්බර් 01